**අගලවත්ත ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව සකස් කරන බව. | යොමුගත ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| (අ) ඉඩමක භුක්තිය වෙනුවෙන් ගෙවන ලද රු.266,587ක පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල රු.767,520 ක් වටිනා යන්ත්‍ර ඉවත් කර තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දී නිරවුල් කරන ලද රු.197,550 ක් වූ ණයහිමි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ බැංකු ගිණුමේ මුදල් පොතට අනුව මුදල් ශේෂය රු.1,230,406 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,134,889 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,218,263 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂයට සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වාරික ගැලපුම් කළ පසු ශේෂය රු.1,081,751 ක් වුවත්, එය රු.1,080,530 ක් ලෙස දක්වා තිබුණි. | මෙම වෙනස සෑම වර්ෂයකම සිදු වන බව. | වෙනසට හේතු සොයාබලා නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) මු.රෙ.104 | අගලවත්ත කිරිහලෙහි පැවති ශීතකරණය අස්ථානගත වීම සම්බන්ධව මූලික පරික්ෂණය සිදු කර තිබුණද වගකිව යුත්තන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කිරිමට කටයුතු කරන බව . | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) මු.රෙ.571 | 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඒකක 15 කින් අය කරන ලද ටෙන්ඩර් තැන්පතු එකතුව රු.403,908 ක් සහ 2004 හා 2011 වර්ෂවලට අදාල පිළිවෙලින් රු.5,000 ක් සහ රු.4,500 ක් වූ ඇප තැන්පතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. . | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.36,892,848 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.23,720,050 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3, 647,580 | 3,518,563 | 2,784,743 | 1,107,353 | 4,377,989 | 4,448,413 | 3,699,567 | 1,586,267 |
| (ii) | කුලී | 6,835,297 | 6,835,297 | 6,519,597 | 315,700 | 5,995,500 | 5,872,772 | 5,680,964 | 191,808 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,260,790 | 1,179,877 | 1,179,877 | - | 420,000 | 378,792 | 378,792 | - |
| | | 11,743,667 | 11,533,737 | 10,484,217 | 1,423,053 | 10,793,489 | 10,699,977 | 9,759,323 | 1,778,075 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වර්ෂයකට අඩු හිඟය රු.366,112 ක් ද , වර්ෂ 01ත් 03 ත් අතර හිඟය රු.414,218 ක් ද , වර්ෂ 03 ත් 05 ත් අතර හිඟය රු.147,195 ක් ද හා වර්ෂ 05 ත් 10 ත් අතර හිඟය රු.147,821 ක් ද විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,807,500 ක් හා මුද්දර ගාස්තු රු.11,000,000 ක් විය. | --එම- | --එම- |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) 2010 වර්ෂයේදී පුර නැගුම ව්‍යාපෘතිය යටතේ සභාව සතු ඉඩමක ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කර තිබුණද ඉදි කිරීම් සම්බන්ධයෙන් අදාල පාර්ශවය සමඟ ඇති කරගත් ගිවිසුමක් සභාව සතුව නොතිබූ අතර අදාල ඉදිකිරීම්වල ප්‍රමිතිය , ගුණත්ත්වය ආදිය පරික්ෂාවකින් තොරව 2016 වර්ෂයේ සභාව විසින් මෙම ගොඩනැගිල්ල භාර ගෙන තිබුණි. | ලිඛිත ගිවිසුමක් මගින් විධිමත්ව පවරා දීමට කටයුතු කරන ලෙස ආපදා කළමනාකරණ අමාත්‍යංශය වෙත ලිපියක් යොමු කර ඇති බව. | සභාව සතු දේපලවල බාහිර පාර්ශව විසින් ඉදි කිරීම් සිදු කිරීමේදී විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගොඩනැගිල්ල භාරගත් වර්ෂයේම එහි ඉදිරිපස කොටසක් කඩා වැටී තිබූ අතර නිසි ප්‍රමිතියකින් තොරව සැදූ ගොඩනැගිල්ල පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබා ගැනීමටත් එය නැවතත් කඩා නොවැටීමටත්, කටයුතු සැලසීම වෙනුවෙන් සභාවට රු.627,745 ක් දැරීමට සිදු වී තිබූ අතර 2020 වර්ෂයේදී ගොඩනැගිල්ල ගර්හිත බැවින් කඩා ඉවත් කිරිමට තීරණය කර තිබුණි. | ගොඩනැගිල්ල නැවත කඩා වැටීම වලක්වා ගැනීමට හා අවට පවතින ගොඩනැගිලිවල ආරක්ෂාවටත් මෙම වියදම් දරා ඇති බව. | සභාවට සිදුවන අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතුය. |

3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සභාව සතු පුස්තකාල විසින් වර්ෂ 08 කට පෙර සිට පාඨකයන්ට බැහැර දෙන ලද පොත් 35 ක් සමාලෝචිත වර්ෂය අවසානයේත් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොත් ගෙන්වා ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බව. | බැහැර දෙන පුස්තකාල පොත් අදාල කාල සීමාව තුල නැවත ලබාගත යුතුය. |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් සභාව විසින් නිරවුල් නොකළ ණය ශේෂය රු.188,756 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | දිගුකාලීන ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| කඩ කුලී ගිවිසුම් ප්‍රකාරව වර්ෂ 02 ට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වුවද, පොදු වෙළඳපොල කඩ කාමරවල 2019 වර්ෂයෙන් පසු බදුකුලී තක්සේරු කර නොතිබුණි. | ඉදිරියේදී සංශෝධනයක් සිදු කිරිමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව වර්ෂ 02 කට වරක් බදු කුලී ප්‍රතිශෝධනය කළ යුතුය. |

3.5 **නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාව සතු ප්‍රොටෝන් ට්‍රක් රථයක් සහ ගල්රෝලක් 2020 වර්ෂයේ සිට නිශ්ක්‍රියව පැවතුණි. | එය වෙනත් සභාවකට පවරා දීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ග ගත යුතුය. |

3.6 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිඳු සුසානභූමියක වැට මායිම් සකස් කර නොතිබුණි. | සුසානභූමි පවරා දීම ප්‍රමාද වී ඇති බවත්, පවරාදීමෙන් පසුව ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කරන බව . | කඩිනමින් සුසානභූමි පවරා ගෙන ආරක්ෂිත වැට මායිම් සකස් කළ යුතුය. |
| (ආ) අගලවත්ත ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 25 ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | කඩිනමින් සුසානභූමි හිමිකම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.7 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාවේ සේවය කොට විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් 2017 හා 2019 වර්ෂවලට අදාල රු.160,170 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර නොතිබුණි. | වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | සේවක ණය ශේෂ අයකර ගත යුතුය. |